# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2021.11.19

වර්ෂ 2021 ක් වූ නොවැම්බර් මස 19 වන සිකුරාදා දින පෙ.ව. 10.00 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**<u>විශේෂ මහා සභා රැස්වීම ආරම්භ වන විට සහභාගී වූ ගරු සභිකවරු</u>**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
05. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
08. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
09. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
10. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
11. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
12. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
13. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
14. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
15. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
16. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
17. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා විසින් විශේෂ මහා සභා රැස්වීමේ වාර්තා තබන ලදී.

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම ඃ-</u>**

**<u>(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>**

**<u>ගරු සභාපතිතුමාගේ අයවැය පණිවුඩය</u>**

බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස බල ප්‍රදේශයේ ජනතා අපේක්ෂාවන් ඉටු කරලීම මාගේ පරම යුතුකමක් වන අතර එම පරමාර්ථය පෙරදැරි කරගෙන 2022 වර්ෂයේ බල ප්‍රදේශයේ සංවර්ධිත ඉලක්කයන් ඇතුළත්ව අයවැය ලේඛනයට මෙසේ සුභපැතුම් පණිවුඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් ලෙස සලකමි.

පළාත් පාලන ආයතනයක් ලෙස අපගේ පූර්ණ වගකීම වනුයේ ජනතාවගේ සුබ විහරණය හා සුභසාධනය යන සියලු පහසුකම් ආරක්ෂා කිරීම සහ වර්ධනය කිරීමට අදාළ සියලු කරුණු විධිමත් කිරීම සහ පාලනය කිරීම වේ. මෙම කරුණු රාශිය ක්‍රියාවට නැංවීමේදී සිවිල් සමාජය, පුරවැසියන් හා පළාත් පාලන ආයතන අතර සබැඳියාවක් නිර්මාණය වීම නිරන්තරයෙන් ගත හැකිය. මෙම සබැඳියාවන් වඩාත් ගුණාත්මකබවින් හා කාර්යක්ෂමතාවයෙන් වර්ධනය කිරීම මාගේ මෙන්ම උප සභාපතිතුමා ඇතුළුව සහෝදර මන්ත්‍රී මණ්ඩලයේ වගකීම හා යුතුකම වන බව මා අදහස් කරන්නෙමි.

මෙම අරමුණු පෙරදැරි කර ගනිමින් 2022 අයවැය තුළින් සහා බල ප්‍රදේශය තුළ දියුණු මංමාවත් පද්ධතියක් ඇති කිරීම, කොවිඩ් 19 වසංගත තත්ත්වයට මුහුණදීමට බල ප්‍රදේශයේ ජනතාව නීරෝගී සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බවට පත් කිරීම උදෙසා සෞඛ්‍ය පහසුකම් නංවාලීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය නිසි අයුරින් නොකඩවා සිදු කරගෙන යාම, වීදි ආලෝකකරණය, සුභසාධක පහසුකම් නංවාලීම සහ කාබනික පොහොර භාවිතය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සහයෝගයක් වශයෙන් සහා බල ප්‍රදේශය තුළ කෘෂිකර්මාන්තයේ යෙදෙන ජනතාවට සහ ගෙවතු වගාවේ නියුතු ජනතාවට පොහොර මලු 10,000 සකස් කර සහන මිලට ලබා දීම මාගේ ප්‍රධාන පරමාර්ථ වේ.

බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා ඉතිහාසය තුළ සභාවාර කීපයකදීම උත්සාහ කල නමුත් සාක්ෂාත් කර ගැනීමට අපොහොසත් වූ මූලික සංවර්ධන ඉලක්කයන් වන කලේගාන වෙළඳ සංකීර්ණය සහ සිට්ට්‍රස් වත්ත ආදාහනාගාරය අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සහ ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මග පෙන්වීම යටතේ සහ ගරු වැවිලි අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමාගේ අනුශාසකත්වය යටතේ මාගේ සභා පාලන කාලය තුළදී ඉදිකිරීම සඳහා මූලික පියවර ගැනීමට හැකිවීම මා ලද විශිෂ්ට ජයග්‍රහණයකි. එමගින් සභා බල ප්‍රදේශය තුළ ජීවත් වන ජනතාවගේ ජීවන තත්වයන් තවදුරටත් නගා සිටුවීමත් දක්ෂිණ අභිමානවත් නවමු පුරවරයක් බවට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය පත් කිරීමත් මාගේ පරම සහ ඒකායන බලාපොරොත්තුවයි.

මෙම අයවැය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුව හා දැනුම ලබාදීමට දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා, දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්තුමා, පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා ඇතුළු ආයතනවලින් ලැබෙන සහයෝගය අගය කරන අතර ඒ සඳහා ප්‍රාදේශීය සභාව වෙනුවෙන් මාගේ ස්තුතිය පුද කරමි.

එමෙන්ම ගරු උප සභාපති සුමිත් ජයසේකර මැතිතුමා ඇතුළු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමන්ලාගෙන් හා මන්ත්‍රීතුමියන්ලාගෙන් සහ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් ලැබෙන සහය බෙහෙවින් අගය කරන අතර ඔබ සැමට සෞභාග්‍යයෙන් පිරුණු නිරෝගී සාමකාමී නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමි.

(ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

<u>වැඩසටහන 01 පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා</u>

සභාව වෙත පැවරී ඇති ව්‍යවස්ථාපිත බලතල, කාර්ය හා යුතුකම් ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම සඳහා සමස්ත කාර්ය මණ්ඩල මෙහෙයවීම හා පාලනය, සභාවේ අරමුදල් පාලනය කිරීම හා සභාව වෙත අයවිය යුතු ආදායම් එකතු කර ගැනීම මෙම වැඩසටහනේ මූලික පරමාර්ථය වේ. එසේම සභාවේ සියළුම පරිපාලන හා විධායක කාර්යයන් සිදු කිරීමද, සභාවේ සැම අංශයක්ම ඒකාබද්ධ කිරීමේ ඒකකය වශයෙන් ක්‍රියා කිරීමද, ගිණුම් කටයුතු නිවැරදිව පවත්වාගෙන යාම හා අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරීමද මෙම වැඩසටහනින් බලාපොරොත්තු වේ.

★ **මෙම වැඩසටහන යටතේ ඇති ආයතන**

1. බෝපෙ පෝද්දල ප්‍රාදේශිය සභා ප්‍රධාන කාර්යාලය
2. බෝපෙ පෝද්දල ප්‍රාදේශිය සභා උප කාර්යාලය

★ **මෙම වැඩසටහන යටතේ ඇති ප්‍රධාන ආදායම් මූලාශ්‍ර**

1. වරිපනම් බදු
2. පාපැදි බලපත්‍ර ගාස්තු
3. වීරීරේඛා ගාස්තු
4. වරිපනම් සංශෝධන ගාස්තු
5. උසාවි දඩ
6. ස්ථාවර තැන්පත් පොළී හා සේවක ණය පොළී
7. මුද්දර ගාස්තු
8. වැටුප් ප්‍රතිපූර්ණ ආදායම
9. වෙන්දේසි හා විකිණුම් ආදායම්
10. වෙනත් ආදායම්

★ **මෙම වැඩසටහන යටතේ ඇති ප්‍රධාන වියදම් මූලාශ්‍ර**

1. කාර්ය මණ්ඩල හා සභික වැටුප් හා දීමනා
2. අතිකාල හා නිවාඩු දින වැටුප්
3. ගමන් වියදම්
4. ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ මිළදී ගැනීම
5. ඉන්ධන වියදම්
6. කැබ් රථ හා ත්‍රී රෝද රථයේ අළුත්වැඩියාව හා නඩත්තුව
7. ජල, විදුලි, දුරකථන හා මුද්‍රණ වියදම්
8. නිල ඇඳුම් වියදම්
9. සංග්‍රහ හා වෙනත් වියදම්

## වැඩසටහන අංක 2 - සෞඛ්‍ය සේවා

ජනතා සුබ විහරණය සඳහා අත්‍යවශ්‍ය සේවාවක් වන සෞඛ්‍ය පහසුකම් සපුරාලීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වේ. ඒ අනුව ප්‍රදේශය තුළ ජනනය වන කැළි කසල ඉවත් කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයන් අනුගමනය කිරීම, බෝවන රෝග, වසංගත හා සනීපාරක්ෂාවට අහිතකර තත්ත්වයන් නැති කිරීම හා ආයුර්වේද වෛද්‍ය සේවා පවත්වාගෙන යාම මෙමගින් බලාපොරොත්තු වේ. එසේම ආහාර පනත ක්‍රියාත්මක කරවීම තුළින් ප්‍රමිතකරණයෙන් තොර ආහාර පරිභෝජනය වැලැක්වීමට කටයුතු කරන අතර, පරිසර අධිකාරියේ මඟපෙන්වීම යටතේ පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීමටද කටයුතු කරනු ඇත.

★ **මෙම වැඩසටහන යටතේ ඇති ආයතන**

1. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයීය ආයුර්වේද බෙහෙත් ශාලාව
2. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා උප කාර්යාලයීය ආයුර්වේද බෙහෙත් ශාලාව
3. උක්වත්ත හා මහ හපුගල සායන

★ **මෙම වැඩසටහන යටතේ ඇති ප්‍රධාන ආදායම් මූලාශ්‍ර**

1. වෙළඳ බලපත්‍ර ගාස්තු
2. පරිසර බලපත්‍ර ගාස්තු
3. පරිසර බලපත්‍ර පරීක්ෂණ ගාස්තු
4. කසළ රැස්කිරීමේ ගාස්තු
5. සුසාන භූමි ගාස්තු
6. කසළ බඳුන් විකිණුම් ආදායම
7. සෞඛ්‍ය ආධාර
8. වැටුප් ප්‍රතිපූර්ණ ආදායම
9. ණය ලැබීම්

★ **මෙම වැඩසටහන යටතේ ඇති ප්‍රධාන වියදම් මූලාශ්‍ර**

1. කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා
2. අතිකාල හා නිවාඩු දින වැටුප්
3. ගමන් වියදම්
4. ලිපිද්‍රව්‍ය හා සෞඛ්‍ය උපකරණ මිළදී ගැනීම
5. ඉන්ධන වියදම්
6. ට්‍රැක්ටර්, ටේලර්, ඩම්ප් ට්‍රක් හා කම්පැක්ටර් රථයේ අළුත්වැඩියාව හා නඩත්තුව
7. ජල, විදුලි හා දුරකථන වියදම්
8. නිල ඇඳුම් වියදම්
9. කසළ ව්‍යාපෘතියේ ගාස්තු, ඩෙංගු මර්ධන හා වෙනත් වියදම්
10. ණය හා පොළී ගෙවීම

## වැඩසටහන අංක 3 - භෞතික සැලසුම්, මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි

ප්‍රාදේශීය සභාව සතු ඉඩම්, ගොඩනැගිලි හා මංමාවත් පවත්වාගෙන යාමත්, අළුත්වැඩියාව හා අළුතින් එකතු කිරීමේ කටයුතු ද ඇතුළුව ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය භෞතික පහසුකම් සපුරාලීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වේ. මෙම වැඩසටහන යටතේ නගර නිර්මාණය, අලුතින් මාර්ග තැනීම, නොදියුණු මාර්ග දියුණු කිරීම්, කාණු හා බෝක්කු ඉදිකිරීම් හා නඩත්තුව තුළින් ක්‍රමානුකූල ජල පරිවහනයක් ඇති කිරීම ආදී සේවාවන් ක්‍රියාත්මක කරනු ලබයි.

එසේම නාගරික සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසිවලට යටත්ව නීත්‍යානුකූලව හා මහජන සෞඛ්‍ය ආරක්ෂා වන අන්දමට සැකසුන නිවාස හා ගොඩනැගිලි ඉදිකිරීම සඳහා උපදේශන සේවා සැපයීම, මඟ පෙන්වීම් සිදු කිරීම සහ නිවාස හා ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමද මෙම වැඩසටහන යටතේ සිදු කෙරේ.

★ **මෙම වැඩසටහන යටතේ ඇති ප්‍රධාන ආදායම් මූලාශ්‍ර**

1. 1% බදු
2. අනුකූලතා සහතික ගාස්තු

3. පෙරසැරි ගාස්තු
4. ඉඩම් හා ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු
5. ගොඩනැගිලි දඩ
6. ජලනල එලීම සඳහා මාර්ග පළුදු කිරීමේ ගාස්තු
7. දැන්වීම් පුවරු ආදායම හා වෙනත් ආදායම්
8. වැටුප් ප්‍රතිපූර්ණ ආදායම
9. මූලධන ලැබීම්

★ **මෙම වැඩසටහන යටතේ ඇති ප්‍රධාන වියදම් මූලාශ්‍ර**

1. කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා
2. අතිකාල හා නිවාඩු දින වැටුප්
3. ගමන් වියදම්
4. ලිපි ද්‍රව්‍ය හා උපකරණ මිළදී ගැනීම
5. ඉන්ධන වියදම්
6. බැකෝ යන්ත්‍රයේ හා අනෙකුත් යන්ත්‍ර අළුත්වැඩියාව හා නඩත්තුව
7. ජල, විදුලි හා දුරකථන වියදම්
8. නිල ඇඳුම් වියදම්
9. ප්‍රීමික්ස් ව්‍යාපෘතියේ වියදම්
10. ප්‍රාග්ධන හෝ සංවර්ධන වැය
11. වෙනත් වියදම් වැඩසටහන

<u>**වැසටහන අංක 5 - වෙනත් උපයෝගීතා සේවා**</u>

ජනතාවගේ එදිනෙදා අවශ්‍යතාවයන් සපුරා ගැනීමේදී අත්‍යවශ්‍ය වන සේවාවන් සැපයීම මෙම වැඩසටහනේ මූලික අරමුණයි. ඒ අනුව පොදු වෙළඳපොළ පවත්වාගෙන යාම හා කළමනාකරණ කිරීම තුලින් ප්‍රාදේශීය ආර්ථිකය වැඩි දියුණු කිරීම, වීදි පහන් සවි කිරීම හා නඩත්තුව, පොදු නාන ස්ථාන පවත්වාගෙන යාම මෙම වැඩසටහන තුළින් බලාපොරොත්තු වේ.

★ **මෙම වැඩසටහන යටතේ ඇති ආයතන**

1. හපුගල ජන සභා ගොඩනැගිල්ල
2. ලබුදූව වෙළඳ සංකීර්ණය
3. කලේගාන මහජන පොළ
4. පෝද්දල කඩකාමර ගොඩනැගිල්ල
5. පළිවතුගොඩ ප්‍රජාශාලාව
6. වටරැක ප්‍රජාශාලාව

★ **මෙම වැඩසටහන යටතේ ඇති ප්‍රධාන ආදායම් මූලාශ්‍ර**

1. කඩකුලී
2. කඩකුලී දඩ
3. පොළ ගාස්තු
4. මස් කඩ ගාස්තු හා දඩ
5. බදු ගාස්තු හා කුලියට දීමේ ගාස්තු
6. සත්ව ඝාතන බලපත්‍ර ගාස්තු
7. ජල ගාස්තු හා ජල බවුසර් ගාස්තු
8. වීදි පහන් විකිණුම් ආදායම
9. වීදි පහන් ආධාර
10. වැටුප් ප්‍රතිපූර්ණ ආදායම

★ **මෙම වැඩසටහන යටතේ ඇති ප්‍රධාන වියදම් මූලාශ්‍ර**

1. කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා
2. අතිකාල හා නිවාඩු දින වැටුප්
3. ගමන් වියදම්
4. ලිපි ද්‍රව්‍ය හා උපකරණ මිළදී ගැනීම

5. ඉන්ධන වියදම්
6. කෘ කැබ් රථයේ අළුත්වැඩියාව හා නඩත්තුව
7. ජල, විදුලි හා දුරකථන වියදම්
8. නිල ඇඳුම් වියදම්
9. වීදි පහන් අළුත්වැඩියාව හා නඩත්තුව
10. වෙනත් වියදම්

**වැඩසටහන අංක 6 - සුභ සාධක සේවා**

මහජන සුභ සාධනය වර්ධනය කිරීමට ඉවහල් වන අයුරින් දැනුම, අවබෝධය හා අන්‍යොන්‍ය එකමුතුකම වර්ධනය කර ගැනීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම වැඩ සටහනේ ප්‍රධාන අරමුණ වේ. ඒ අනුව පුස්තකාල හා ප්‍රජා ශාලා සේවාවන් පවත්වාගෙන යාම, ප්‍රදේශයේ ක්‍රීඩා කටයුතු දියුණු කිරීම සඳහා ක්‍රීඩා භූමි ඉදිකිරීම හා නඩත්තු කිරීම, ළදරු අධ්‍යාපනය සඳහා පෙර පාසල් පවත්වාගෙන යාම හා පාලනය කිරීම. ප්‍රදේශයේ ළිං, පොකුණු ඉදිකිරීම හා නඩත්තු කිරීම ආදී සේවාවන් මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබයි.

★ **මෙම වැඩසටහන යටතේ ඇති ආයතන**

1. බෝපෙ පෝද්දල ප්‍රාදේශිය සභා ප්‍රධාන කාර්යාලයීය පුස්තකාලය
2. බෝපෙ පෝද්දල ප්‍රාදේශිය සභා උප කාර්යාලයීය පුස්තකාලය
3. බෝපෙ පෝද්දල ප්‍රාදේශිය සභා ප්‍රධාන කාර්යාලයීය පෙරපාසල
4. හිරිඹුරගම සුමුදු පෙරපාසල
5. පෝද්දල ක්‍රීඩාංගනය
6. ලබුදූව ක්‍රීඩාංගනය
7. හපුගල ක්‍රීඩාංගනය

★ **මෙම වැඩසටහන යටතේ ඇති ප්‍රධාන ආදායම් මූලාශ්‍ර**

1. විනෝද බදු
2. ප්‍රසිද්ධ ප්‍රදර්ශන බලපත්‍ර ගාස්තු
3. නැණසල සේවා ගාස්තු
4. පුස්තකාල ආදායම්
5. පුවත්පත් විකුණුම් ආදායම
6. පුස්තකාල ආධාර
7. වැටුප් ප්‍රතිපූර්ණ ආදායම

★ **මෙම වැඩසටහන යටතේ ඇති ප්‍රධාන වියදම් මූලාශ්‍ර**

1. කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා
2. අතිකාල හා නිවාඩු දින වැටුප්
3. ගමන් වියදම්
4. පුවත්පත් හා උපකරණ මිලදීගැනීම
5. පොත් බැඳීම් ගාස්තු
6. පොත් හා ලී බඩු මිලදී ගැනීම
7. ජල, විදුලි හා දුරකථන වියදම්
8. වෙනත් වියදම්

(ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව අයවැය සාරාංශය - 2022**

**2022 වර්ෂයට අපේක්ෂිත මුළු ආදායම - රු. 223,894,000**
**පුනරාවර්තන ආදායම - රු. 158,894,000**
**ප්‍රාග්ධන ආදායම - රු. 65,000,000**

**2022 වර්ෂයට අපේක්ෂිත මුළු පුනරාවර්තන ආදායම - රු. 158,894,000**

| | |
|---|---|
| • වරිපනම් හා බදු | 18,430,000 |
| • කුලී | 4,441,500 |
| • බලපත්‍ර ගාස්තු | 1,260,150 |
| • සේවා සඳහා ගාස්තු | 7,355,000 |
| • වරෙන්තු ගාස්තු හා දඩ | 2,075,860 |
| • වෙනත් ආදායම් | 71,069,000 |
| • ආදායම් ආධාර | 54,262,490 |
| | **158,894,000** |

**2022 වර්ෂයට අපේක්ෂිත මුළු ප්‍රාග්ධන ආදායම - රු. 65,000,000**

| | |
|---|---|
| • ප්‍රාග්ධන ආධාර | 15,000,000 |
| • ණය ලැබීම් | 50,000,000 |
| | **65,000,000** |

**2022 වර්ෂයට අපේක්ෂිත මුළු වියදම - රු. 223,894,000**

**පුනරාවර්තන වියදම රු. 96,980,000**
**ප්‍රාග්ධන වියදම රු.126,914,000**

**2022 වර්ෂයට අපේක්ෂිත මුළු පුනරාවර්තන වියදම - රු. 96,980,000**

| | |
|---|---|
| • වැටුප් හා දීමනා | 65,647,000 |
| • ගමන් වියදම් | 1,610,000 |
| • සැපයුම් හා උපකරණ | 7,781,000 |
| • ප්‍රාග්ධන වත්කම් අ.වැ. හා නඩත්තු | 8,900,000 |
| • වෙනත් ආවශ්‍යක සේවා | 10,805,500 |
| • පොළී ගෙවීම් | - |
| • ආධාර මුදල් හා සහනාධාර | 102,500 |
| • විශ්‍රාම වැටුප් | 2,134,000 |
| | **96,980,000** |

**2022 වර්ෂයට අපේක්ෂිත මුළු ප්‍රාග්ධන වියදම - රු. 126,914,000**

| | |
|---|---|
| • ප්‍රාග්ධන වැය | **126,914,000** |
| • ණය ආපසු ගෙවීම් | - |
| | **126,914,000** |

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ- නැත**

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඃ- නැත**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා**

**01.** 2022 වර්ෂය සඳහා අදාළ අයවැය සභා සම්මත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමාගේ හතරවන අයවැය සඳහා සුභ පැතුම් එක් කරන බවත්, පැවති අපහසුතා මධ්‍යයේ පළාත් පාලන මැතිවරණය 2018 වර්ෂයේදී ජයග්‍රහණය කොට ඉන් අනතුරුව පැවති ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය ජයග්‍රහණය කොට වත්මන් රාජ්‍ය නායකත්වය සහ බලය ලබා ගත් බවත්, ඒ සඳහා පළාත් පාලන ආයතනවල නියෝජිතයින් ගම් මට්ටමින් සහයෝගය ලබා දුන් බවත්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නවක පක්ෂයක් ලෙස පැවති මැතිවරණවලදී අතිවිශාල ජයග්‍රහණ ලබා ගත් බවත්, වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සහ අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් රටේ පැවති මරබිය අවසන් කොට නිදහස් හා නිවහල් රාජ්‍යයක් බිහිකළ බවත්, සෞභාග්‍යයේ දැක්ම ගම තුළ ඇති කිරීම සඳහා ගරු සභාපතිවරයා සමඟ තමා කටයුතු කරන බවත්, මෙම අයවැය ජයග්‍රහණය කිරීම සඳහා සම්පූර්ණ සහයෝගය ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලද ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් පුස්තකාල සඳහා පොත් මිලදී ගැනීමට රුපියල් ලක්ෂ පහක මුදලක් වෙන් කිරීමට යෝජනා කළ නමුත්, ඉදිරිපත් කරන ලද අයවැයෙන් වෙන්කොට ඇත්තේ රුපියල් ලක්ෂ තුනක් බැවින් එසේ වීමට හේතුව කුමක්දැයි ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

මෙම වර්ෂය සඳහා රුපියල් ලක්ෂ හතරක පොත් මිලදී ගැනීම සඳහා ඇණවුම් කොට ඇති බවත්, ලබන අවුරුද්ද වන විට රුපියල් ලක්ෂ හතක පොත් මිලදී ගන්නා බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

රුපියල් ලක්ෂ පහක් පුස්තකාල සඳහා අවශ්‍ය පොත් මිලදී ගැනීම සඳහා අයවැයෙන් වෙන් කිරීමට යෝජනා කළ නමුත්, රුපියල් ලක්ෂ තුනක් ඒ සඳහා ප්‍රමාණවත් නම් එය ගැටළුවක් නොවන බවත්, අවශ්‍ය සම්පත් ලබා දී සෞඛ්‍ය ආරක්ෂිත ලෙස පුස්තකාල මහජනතාව වෙත විවෘත කරන ලෙසත්, 2022 වර්ෂය අප ප්‍රාදේශීය සභාවට තීරණාත්මක වර්ෂයක් බවත්, කලේගාන වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල සහ සිට්ටුස් වත්තේ ආදාහනාගාරය ඉදිකරන බැවින්, ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලද ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් මහජන නියෝජිතවරුන්ට නිසි ගෞරවය ලැබෙන පරිදි කටයුතු කරන ලෙස සහ නිසි ගෞරවය ලැබෙන පරිදි ආමන්ත්‍රණය කරන ලෙස නිලධාරීන්ව දැනුවත් කරන මෙන් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

අද වන විට රට තුළ තිබෙන තත්ත්වය හොඳ මට්ටමක නොතිබුණ නමුත්, මෙම තත්ත්වය ඉතිහාසයේ සැමදාම තිබුණ බවත්, 1971 වර්ෂයේ දී රට තුළ කැරැල්ලක් ඇති වූ බැවින්, එවකට අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියට රාජ්‍ය පාලනය සඳහා අපහසුතා ඇති වූ බවත්, 1977 වර්ෂයේදී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා හයෙන් පහක බලයක් ලබා ගෙන රාජ්‍ය නායකත්වයට පත් වුවද 1983 වර්ෂය වන විට කළු ජූලිය කෝලාහලය ඇති වූ බවත්, ආර්. ප්‍රේමදාස මැතිතුමාගේ පාලන කාලයේදී 1988 වර්ෂයේදී නැවත රට තුළ කැරැල්ලක් ඇති වූ බවත්, ඩී.බී. විජේතුංග මැතිතුමාටද වැඩි කාලයක් ජනාධිපතිධූරය දැරීමට නොහැකි වූ බවත්, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය ජනාධිපති ධූරයට පත් වූ පසු සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර වැනි තනතුරු ඇති කොට විශේෂ වූ සේවාවන් සඳහා පුද්ගලයන් බඳවා ගැනීමට කටයුතු කළ බවත්, 2002 වර්ෂයේදී රනිල් වික්‍රමසිංහ මැතිතුමා අග්‍රාමාත්‍යධූරයට පත් වූ බවත්, 2005 වර්ෂයේදී ජනාධිපති ධූරයට පත් වූ මහින්ද රාජපක්ෂ මැතිතුමා හා එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා රට තුළ පැවති යුද්ධය අවසන් කළ බවත්, 2015 වර්ෂයේදී මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති ධූරයට පත් වූ බවත්, ඊට පසු 2019 වර්ෂයේදී ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති ධූරයට පත් වූ බවත්, 2020 වර්ෂයේ සිට කොවිඩ් වසංගතය පැතිරීම හේතුවෙන් විදේශ මුදල් සංචිත හිඟ වීම නිසා රට තුළ අර්බුදකාරී තත්ත්වයක් පැන නැගී ඇති නමුත් අප ප්‍රාදේශීය සභාව තුළ සංවර්ධන කටයුතු වෙනුවෙන් මැදිහත් වෙන බවත්, අප රට යහමඟට ගැනීමට තමා බැඳී සිටින බවත් ප්‍රකාශ කරන ලද ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අයවැය සඳහා සුභ පතන ලදී.

පසුගිය පළාත් පාලන මැතිවරණයේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ කොට්ඨාශ 11 ක් ජයග්‍රහණය කළ නමුත්, බෝනස් මන්ත්‍රීධූර හිමි නොවූ බවත්, තමා විසින් ඉදිරිපත් කරන ලද සෑම අයවැයකදීම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සියළුම මන්ත්‍රීවරු සහයෝගය ලබා දුන් බවත්, ගිය අයවැයේදී ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා, ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා, ගරු මන්ත්‍රී එම්.එන්.එච්. කියාස් මැතිතුමා සහ ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා පක්ෂව

ඡන්දය ලබා දීමෙන් සහයෝගය ලබා දුන් බවත්, ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඡන්දය භාවිතා කිරීමෙන් වැළකී සිටීමෙන් සහයෝගය ලබා දුන් බවත්, 2020 වර්ෂයේ මාර්තු මාසයේ සිට කොරෝනා වසංගතය සමඟ රට ඉදිරියට ගමන් කරමින් පවතින බවත්, විවිධ අපහසුතා හා බාධාවන් මතුවුණද ඉතා ශක්තිමත් ලෙස ප්‍රාදේශීය සභාවේ කටයුතු කරගෙන ගිය බවත්, 2020 වර්ෂයේදී කොරෝනා වසංගතය හමුවේ රට තුළ ඇඳිරිනීතිය ක්‍රියාත්මක වන අවස්ථාවේ රුපියල් ලක්ෂ 40 ක වියළි ආහාර අඩු ආදායම්ලාභී ජනතාව වෙත බෙදා දුන් බවත්, මේ වන විට කොට්ඨාශවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රුපියල් ලක්ෂ 30 ක් බැගින් ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කළ බවත්, එක් කොට්ඨාශයක් සඳහා වීදි පහන් කට්ටල 150 ක්ද, කෝබ්‍රා වීදි පහන් කට්ටල 20 ක්ද ලබා දුන් බවත්, කොරෝනා ආසාදිතයන් සිටින නිවාස පවා පසුගිය කාල සීමාව තුළදී විෂබීජහරණයට ලක් කිරීමට කටයුතු කළ බවත්, රාජ්‍ය ආයතන සහ ඉල්ලීම් කරන ලද අනෙකුත් පොදු ස්ථානද විෂබීජහරණ කටයුතු සිදු කළ බවත්, බලප්‍රදේශයේ ජනතාව එන්නත්කරණ කටයුතු සඳහා අවශ්‍ය සියළුම සහයෝගය ලබා දීමට කටයුතු කළ බවත්, කොරෝනා වසංගතය අභියෝගයක් බවට පත් කර නොගනිමින් කාර්යාල කටයුතු අඩපණවීමකින් තොරව පවත්වා ගෙන යාමට කටයුතු කළ බවත්, ඒ සඳහා ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන්ට සහ අනෙකුත් සේවකයන්ට ස්තූතිය පළ කරන බවත්, කලේගාන වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ වැඩ කටයුතු මේ වන විට ඉදිකරගෙන යන අතර, එහි පළමු මහළ ටෙන්ඩර් කොට ඉන් ලැබෙන එක්වන් මුදල භාවිතා කොට දෙවන හා තෙවන මහලේ වැඩ කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බවත්, සිට්ට්‍රස් වත්තේ ආදාහනාගාරය ඉදිකිරීමේ කටයුතු සඳහා මෙම අයවැයෙන් මුදල් වෙන්කොට ඇති බවත්, ලැන්දෑව මහා බෝධි සමාගම සතු ඉඩම අත්පත් කරගෙන එම ස්ථානයේ පොළක් ඉදිකිරීමට බලාපොරොත්තු වන බවත්, කලේගාන ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කොට ඇති බවත්, තම පාලන කාලය තුළ විවිධ වූ බාධක මධ්‍යයේ අප ප්‍රාදේශීය සභාව විශාල දුරක් පැමිණ ඇති බවත්, බලප්‍රදේශය තුළ සිදු කරනු ලබන වෙන්දේසි ඉඩම් වලින් මුද්දර ගාස්තු ලෙස සහ 1% ක ගාස්තු ලෙස විශාල ආදායමක් ලැබෙන බවත්, 2021 වර්ෂය වැඩිම මුද්දර ගාස්තු ආදායමක් ලැබෙන වර්ෂය බවට පත්ව ඇති බවත්, එළඹෙන වර්ෂයේදී කොට්ඨාශවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රමාණවත් මුදලක් වෙන් කිරීමට බලාපොරොත්තු වන බවත්, මධ්‍යම රජය මඟින්ද 2022 වර්ෂයේදී ග්‍රාමීය මට්ටමින් විශාල සංවර්ධන කටයුතු සිදු කිරීමට බලාපොරොත්තුවෙන් සිටින බවත්, එමඟින් අප ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ මාර්ග විශාල ප්‍රමාණයක් සංවර්ධනය කළ හැකි බවත්, මේ වන විට බලප්‍රදේශය තුළ ඇති මාර්ග බොහෝ ප්‍රමාණයක් කාපට් අතුරා සංවර්ධන කොට ඇති බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

පසුගිය කාලයේදී විවිධ වූ අපහසුතාවන්ට ලක් වීමට සිදු වුවද, සංවර්ධන කටයුතුවල අඩුවක් සිදු නොකළ බවත්, කොරෝනා උවදුර මධ්‍යයේ වුවද ප්‍රාදේශීය සභාවෙන් ඉටු විය යුතු මූලික සේවාවන් සැපයූ බවත් 2022 වර්ෂයේදී කලේගාන වෙළඳසංකීර්ණය ඉදිකිරීම සඳහා සහ සිට්ට්‍රස් වත්තේ ආදාහනාගාරය ඉදිකිරීම සඳහා මුදල් වෙන්කොට ඇති බවත්, රුපියල් කෝටි විසි දෙකකට අධික අයවැයක් ඉදිරිපත් කර ඇති නමුත්, ඉන් හරි අඩක්ම නිශ්චිත වියදම් ලෙස වෙන් කොට ඇති බවත්, ඉදිරි වසර තුළ ප්‍රාදේශීය සභාව ලෙස අතිමහත් කාර්යයභාරයක් ඉෂ්ට කිරීමට හැකි බවත්, අප ප්‍රාදේශීය සභාවේ ඇති මූලික ගැටළු විසඳෙන බවට පෙරමග ලකුණු පහළ වී ඇති බවත්, ජනතාවට ප්‍රතිලාභයක් ලැබෙමින් බලප්‍රදේශයට වඩා ඵලදායි සේවයක් ලැබීමට යෝජනා කර ඇති මෙම අයවැය ලේඛනයට විරුද්ධ වීම සදාචාර සම්පන්න තීරණයක් ලෙස නොදකින බවත්, 2022 වර්ෂයේ බෝපෙ පෝද්දල ජනතාවට ඉතාමත් ඵලදායි සේවයක් ඉටු කිරීමට හැකි වන බැවින්, මම අයවැය ලේඛනයට සුභ පතන බවත්, මෙම අයවැය ලේඛනයේ පිටු අංක නොකිරීම අඩුපාඩුවක් බවත් ප්‍රකාශ කරන ලද ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභා බලප්‍රදේශයේ මාර්ග සහ මංමාවත් සංවර්ධනය සඳහා ආදාහනාගාරය, බොජුන්හලක් ඉදිකිරීම ආදී සංවර්ධන වැඩසටහන් සඳහා රුපියල් ලක්ෂ තිහක ප්‍රතිපාදන වෙන් කිරීම ලෙස සඳහන්වීම පිළිබඳව පැහැදිලි කිරීමක් සිදු කරන ලෙස ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

2022 වර්ෂය සඳහා රුපියල් කෝටි 22 ක මුදලක් වෙන් කිරීම පිළිබඳව සිය ස්තූතිය පළ කරන බවත්, පසුගිය වසර වලදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් තමා සහ ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා අයවැයට සහයෝගය ලබා දුන් නමුත්, තම පක්ෂය වෙත ප්‍රතිපාදන වෙන් නොවූ බවත්, වැලිකැටිය වත්ත මාර්ගයේ පැති බැම්ම ඉදිකර දෙන ලෙස යෝජනා ඉදිරිපත් කළ පසු සභා අරමුදලින් ලක්ෂ පහක ප්‍රතිපාදන සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලක්ෂ පහළොවක ප්‍රතිපාදන යොදා ගනිමින් පැතිබැම්මේ කොටසක් සංවර්ධනය කර දෙන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් තමා වෙත එකඟතාවය පළ කළ නමුත් එය ඉෂ්ට නොවූ බවත්, කලේගාන වෙළඳසංකීර්ණය ඉදිකිරීම සඳහා මුල් ගල් තැබීමේ උත්සවයට සහ ගම සමඟ පිළිසඳරක් වැඩසටහනේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආසන සංවිධායකවරුන්ට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ආරාධනා නොකළ බැවින්, ඒ සඳහා කණගාටු වන බවත්, 2022 වර්ෂයට ඉදිරිපත් කරන ලද අයවැය සුභ අයවැයක් බවට පත්වන ලෙස තමා ප්‍රාර්ථනා කරන බවත් ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

හිටපු පළාත් සභා අමාත්‍ය යූ.පී.ඩී. ආරියතිලක මැතිතුමාගේ ලක්ෂ දෙකක ප්‍රතිපාදන මත ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමාගේ ඉල්ලීම පරිදි හපුගල ප්‍රදේශයේ සංවර්ධන කටයුත්තක් සිදු කළ බවත්, එහිදී සභාවෙනුත් ප්‍රතිපාදන යොදමින් කාණු පද්ධතියක්ද සංවර්ධනය කළ බවත්, වීදි පහන් කට්ටල යෙදීමට ස්ථාන පහක් නම් කර ලබා දෙන ලෙස ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් දෙදෙනාගෙන් ඉල්ලීම් කළ නමුත් එය ඉටු නොවූ බවත්, වැලිකැටිය වත්ත මාර්ගයේ පැතිබැම්ම ඉදිකිරීම සඳහා ලක්ෂ පහක ප්‍රතිපාදන වෙන් කිරීමට තමා එකඟතාවය පළ කළ නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ලැබෙන ප්‍රතිපාදන සම්බන්ධව තමාට නිශ්චිත එකඟතාවයක් ලබාදිය නොහැකි බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් වීදි පහන් කට්ටල පහක් සවි කිරීම සඳහා කරන ලද ඉල්ලීම තමා ප්‍රතික්ෂේප කිරීමට හේතුව එම අවස්ථාවේදීම ප්‍රකාශ කළ බවත්, 2001 වර්ෂයේ සිට පැවති ගැටළුවක් විසඳීම සඳහා හිටපු පළාත් සභා අමාත්‍ය යූ.පී.ඩී. ආරියතිලක මැතිතුමාගේ ලක්ෂ දෙකක ප්‍රතිපාදන මත හපුගල ප්‍රදේශයේ අදාළ සංවර්ධන කටයුත්ත සිදු කළ නමුත් එම ප්‍රතිපාදන වෙන් වී තිබුණේ නාවින්න ප්‍රදේශයට බවත්, නාවින්න ප්‍රදේශයේ අදාළ මාර්ගය සංවර්ධනය කිරීමට අවස්ථාව හිමි නොවූ බැවින් එම සංවර්ධන කටයුත්ත හපුගල ප්‍රදේශයේ සිදු කිරීමට තමා බලපෑම් කළ නමුත්, එය සිදු කරන ලද්දේ ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ මැදිහත්වීම මත බවත්, මීන් පෙර වසරවලදී අයවැයට සහය ලබාදෙන ගරු මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන ලබා දෙන බවට ප්‍රකාශ කළද, එය මෙතෙක් ඉටු නොවූ බවත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ලෙස තම පක්ෂය විපක්ෂය නියෝජනය කරන පක්ෂයක් සේ සලකා ප්‍රාදේශීය සභාවේ වැදගත් අවස්ථාවලදී සහ උත්සව අවස්ථාවලදී සහභාගි කර නොගත් බවත්, මෙම හේතු සම්බන්ධයෙන් කළකිරීමක් ඇති බැවින්, මෙම අයවැය සඳහා තම විරෝධතාවය ප්‍රකාශ කරන බවත්, ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම අයවැය සම්බන්ධව දීර්ඝ වශයෙන් සාකච්ඡා නොකොට ඉදිරිපත් කරන ලද අයවැය සම්බන්ධව තමාට ඇති ගැටළු නිරාකරණය කර ගැනීමට අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලද ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් පසුගිය වර්ෂයේ අයවැයට සමාන වන ලෙස මෙම වර්ෂයේ අයවැය ඉදිරිපත් කර ඇති නමුත්, විශේෂ වූ සංවර්ධන ක්‍රියාවලියන් වෙනුවෙන් මෙම වර්ෂයේ අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කර ඇති අතර සමස්ත අයවැයෙන් අඩකට ආසන්න මුදලක් වෙන් කොට ඇත්තේ පුනරාවර්තන වියදම් සඳහා බවත්, ඉතුරු කොටස සංවර්ධන ව්‍යාපෘති සඳහා සහ අනෙකුත් විශේෂ කාරණා වෙනුවෙන් වෙන් කොට ඇති බවත්, කලේගාන වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා රුපියල් කෝටි පහක මුදලක් මූලධන ආධාර ලෙස වෙන්කොට ඇති බවත්, එම රුපියල් කෝටි පහක මුදල මූලධන ආධාර වශයෙන් නොව ණය ආධාර වශයෙන් සඳහන් විය යුතු බවත්, මෙය දීර්ඝකාලීන ණය මූලාශ්‍රයක් බවත් ප්‍රකාශ කරන ලදී.

කලේගාන වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා අඩු ණය පොලී අනුපාතයක් යටතේ දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් රුපියල් කෝටි පහක ණය මුදලක් ලබා ගන්නා බවත්, ඒ සඳහා වසර දෙකක නිදහස් කාලසීමාවක් ඇති බවත්, සම්පූර්ණ ණය මුදල වසර දහයක කාලසීමාවක් ඇතුළත මාසික වාරික වශයෙන් ගෙවිය යුතු බවත්, කලේගාන වෙළඳ සංකීර්ණයේ පහළ මහළ ඉදිරියේදී ටෙන්ඩර් කොට එක්වන් මුදලක් ලබා ගෙන වෙළඳ සංකීර්ණයේ ඉතිරි වැඩ කටයුතු ආරම්භ කරන බවත්, රුපියල් ලක්ෂ හතක මාසික ආදායමක් එම වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ලෙන් බලාපොරොත්තු වන බවත්, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට පිවිසුම් ස්ථානයක් වන කලේගාන මංසන්ධිය මෙම වෙළඳ සංකීර්ණය ඉදිකිරීමත් සමඟ අලංකාරයට පත් වන බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ප්‍රාදේශීය සභාවක් යනු ලාභ අරමුණු කොට ගෙන සේවා සපයන ආයතනයක් නොවන බැවින්, ජනතා සුභ සිද්ධිය උදෙසා ක්‍රමවත්ව සහ නිවැරදිව ක්‍රියා කළ යුතු බවත්, මෙම ණය මුදල දැනට පවතින සභාවේ කාල සීමාවෙන් පසුවද ගෙවීමට සිදු වන බවත්, සෞඛ්‍ය සේවා යටතේ සිට්ටුස් වත්තේ ආදාහනාගාරය ඉදිකිරීම සඳහා සභා අරමුදලෙන් ප්‍රතිපාදන වෙන් කොට ඇති බවත්, ප්‍රකාශ කරන ලද ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් සභා ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රුපියල් ලක්ෂ හතළිහක ප්‍රතිපාදන වෙන් කොට තිබීම පිළිබඳව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

සභා ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රුපියල් ලක්ෂ හතළිහක ප්‍රතිපාදන වෙන් කර ඇත්තේ යම් කිසි අවශ්‍යතාවයක් මතු වුවහොත් ප්‍රයෝජනයට ගැනීමට බවත්, සභා ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සභා අරමුදලින් යම් වියදමක් දැරීමට සිදු වුවහොත් යන උපකල්පනය මත එම මුදල් සංකේතාත්මකව වෙන් කර ඇති බවත්, එම මුදල් සේවා අවශ්‍යතාවය මත වෙනත් කාර්යයක් සඳහා වුවද යොදා ගැනීමට හැකියාව ඇති බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

අයවැය සඳහා ආදායම් ප්‍රවර්ධන යෝජනා ලෙස කලේගාන වෙළඳ සංකීර්ණය ඉදිකිරීම තුළින් ආදායම් උත්පාදනය කිරීමටත්, සභාවේ ආදායම් මූලාශ්‍ර වශයෙන් හිඟ දඩ මුදල්, මුද්දර ගාස්තු සහ 5% කින් වැඩි කරන ලද සේවා ගාස්තු ඇතුළත් කර ඇති බවත්, ප්‍රාදේශීය සභාව වශයෙන් වියදම් දරන්නේ ජනතාවගේ බදු මුදල් බැවින්, මෙම ප්‍රශ්න කිරීම සිදු කරන බවත්, ගියවර අයවැයේ නොතිබූ ආදායම් මූලාශ්‍ර ලෙස වරිපනම් ලේඛනයේ සංශෝධිත නම සහ අංකය ලියාපදිංචි කිරීමේ ගාස්තු ලෙස රුපියල් තුන්සීයක මුදලකුත්, පරිසර බලපත්‍රය ලබා නොගත යුතු බවට ලිපියක් නිකුත් කිරීමේ ගාස්තු ලෙස රුපියල් පන්සීයක මුදලකුත් අය කිරීමට යෝජනා කර ඇති බවත්, 2020 වර්ෂයේ සෞඛ්‍ය සේවා සඳහා ප්‍රාග්ධන උපකරණ මිලදී ගැනීමට රුපියල් ලක්ෂ අනූ පහක මුදලක් වෙන් කර තිබූ නමුත් ඉන් වියදම් කර තිබුණේ රුපියල් පන්දහස් පන්සියයක් පමණක් බවත්, සංවර්ධන කාර්යයන් සඳහා මූලධන ආධාර ලෙස රුපියල් ලක්ෂ 150 ක මුදලක් සඳහන් කොට ඇති බවත් ප්‍රකාශ කරන ලද ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් සෞඛ්‍ය සේවා සඳහා වෙන්කොට ඇති ප්‍රතිපාදන වලින් ආදාහනාගාරය ඉදිකිරීමෙන් පසු ඉතිරිවන ප්‍රතිපාදන සඳහා කිරීමට බලාපොරොත්තු වන කාර්යයන් සම්බන්ධව පැහැදිලි කිරීමක් සිදු කරන ලෙස, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් මෙම අයවැය සඳහා පෙන්වා දෙනු ලබන, සියළුම අඩුපාඩු සහ අනෙකුත් කරුණු නිවැරදි කිරීමට තමා එකඟතාවය පළ කරන බවත්, මෙම අයවැය සභා සම්මත කිරීම සඳහා සහයෝගය ලබා දෙනවාද යනුවෙන් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

මෙම අයවැයෙන් බලප්‍රදේශයේ ජනතාව වෙත සහන ලබා දී නැති බවත්, මෙම අයවැයේ අන්තර්ගත වී ඇත්තේ ණය ගොඩක් සහ බදු ගොඩක් පමණක් බවත්, මෙම අයවැයෙන් ඉලක්කම් හරඹ කොට තිබුණද, ඉන් 30% ක් ණය බවත් වසර දහයකට අප ප්‍රාදේශීය සභාව ණයකට හිරකරන බවත් ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

(සභාව ඝෝෂාකාරි විය.)

**සංශෝධන :- 01.** 2022 වර්ෂයේ අදායම් වියදම් විස්තරාත්මක ඇස්තමේන්තු සාරාංශයේ (වැඩසටහන් අනුව) වියදම් හා වැය විෂය සංකේත නාම තීරුවේ අංක 03. ප්‍රාග්ධන අදායම් යටතේ අංක 81. මූලධන ආධාර යටතේ පොදු උපයෝගීතා සේවා සඳහා වෙන්කර ඇති රු.50,000,000.00ක මුදල, 2022 වර්ෂයේ අදායම් වියදම් විස්තරාත්මක ඇස්තමේන්තු සාරාංශයේ (වැඩසටහන් අනුව) වියදම් හා වැය විෂය සංකේත නාම තීරුවේ අංක 03. ප්‍රාග්ධන අදායම් යටතේ අංක 82. ණය ආධාර යටතේ පොදු උපයෝගීතා සේවා සඳහා වෙන්කර ඇති රු.50,000,000.00ක මුදල ලෙස සංශෝධනය කිරීම.

2022 වර්ෂයේ අයවැය සඳහා ඉහත සංශෝධනය ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**සංශෝධන :- 02.** (03) වැඩසටහන - භෞතික සැලසුම් හා මංමාවත් අංශය යටතේ සහා බල ප්‍රදේශයේ මාර්ග හා මංමාවත් සංවර්ධනය සඳහාත් ආදාහනාගාරයක්, බොජුන්හලක් ඉදිකිරීම ආදී සංවර්ධන වැඩසටහන් සඳහා රු.3,000,000.00ක ප්‍රතිපාදන වෙන් කිරීම, (03) වැඩසටහන- භෞතික සැලසුම් හා මංමාවත් අංශය යටතේ සහා බල ප්‍රදේශයේ මාර්ග හා මංමාවත් ආදී සංවර්ධන වැඩසටහන් සඳහා රු.20,000,000.00ක ප්‍රතිපාදන වෙන් කිරීම ලෙස සංශෝධනය කිරීම

2022 වර්ෂයේ අයවැය සඳහා ඉහත සංශෝධනය ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

2020 වර්ෂයේදී කසළ දාහක යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා රුපියල් ලක්ෂ අනූපහක මුදලක් අයවැය මඟින් වෙන්කර තිබුණද, එම කසළ දාහක යන්ත්‍රය මිලදී නොගත් බවත්, රුපියල් පන්දහස් පන්සීයක මුදලක් වැයකොට වතුර ටැංකියක් මිලදී ගෙන තිබූ අතර, එම ගෙවීම් කටයුතු මෙම මුදල් වෙන්කිරීම හරහා සිදු කර ඇති බවත්, සෞඛ්‍ය කටයුතු වලට අමතරව විෂබීජහරණ කටයුතු සඳහා 2020 වර්ෂයේදී පුනරාවර්තන වියදම් හරහා විශාල වියදමක් සභා අරමුදලින් දරා ඇති බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

කර්මාන්ත බදු යටතේ බැටරියෙන් ක්‍රියා කරන මෝටර් රථවල බැටරි ආරෝපණ කරන ස්ථානයක් පවත්වාගෙන යාම සහ ස්වර්ණාභරණ (රන් හා රිදී) නිපදවීම හා අළුත්වැඩියාව / පාට කිරීම / අලෙවිය සිදු කරන ව්‍යාපාර අළුතින් ඇතුළත් කිරීම අයවැය යෝජනා ලෙස ඉදිරිපත් කර ඇත්තේ කුමන හේතුවක්

නිසාදැයි ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

මෙම කර්මාන්ත බලප්‍රදේශය තුළ ඇති බැවින්, ඒවාගෙන් බදු ලබා ගැනීමට බලාපොරොත්තු වන බැවින්, එමගින් සභාවට ආදායමක් උත්පාදනය වන නිසා මෙය නව ආදායම් මූලාශ්‍රයක් බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම අයවැයෙන් 30% ක් ණය බවත්, 50% ක් වෙන්කොට ඇත්තේ පුනරාවර්තන වියදම් සඳහා බවත්, ප්‍රාග්ධන වියදම් ලෙස ඉතා සුළු ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කොට ඇති බවත්, ජනතාවගේ සුභ සාධන කටයුතු සඳහා සහ ජනතාව අතර, බෙදී යන අංශ ගැන පැහැදලි කිරීම් මෙම අයවැයේ අන්තර්ගත වී නොමැති බවත්, බලප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා කිසිදු යෝජනාවක් මෙම අයවැයට අන්තර්ගත කොට නොමැති බවත් ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මධ්‍යම රජයෙන් ගමට සංවර්ධන ව්‍යාපෘති රාශියක් ඉදිරි වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට ඇති බවත්, ඊට අමතරව සභා අරමුදලින්ද කොට්ඨාශ මට්ටමින් සංවර්ධන කටයුතු සිදු කරන බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

**(තේ පානය සඳහා සභාව කල් තබන ලදී.)**

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද දෙවැනි සංශෝධනය අනුව බොජුන්හලක් ඉදිකිරීමේ යෝජනාව ඉවත්වුණිද යනුවෙන් ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් කෝටි 12 ක ප්‍රතිපාදන වෙන් කොට ඇති බවත්, එක්ස්කැවේටර් යන්ත්‍රයක් මිලදී ගැනීම, ආදාහනාගාරය ඉදිකිරීම, කලේගාන වෙළඳ සංකීර්ණය ඉදිකිරීම, බොජුන්හලක් ඉදිකිරීම, මංමාවත් ඉදිකිරීම සහ අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා එම ප්‍රතිපාදන වෙන්කොට ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙහි සිටින සියළුම ගරු මන්ත්‍රීවරුන්ට අයවැය සඳහා අදහස් දැක්වීමට ලැබෙන අවසන් අවස්ථාව මෙය බවත්, පුස්තකාල සඳහා පොත් මිලදී ගැනීම පිළිබඳව ගරු සභාපතිතුමා විසින් දරන ලද අදහස වැරදි බවත්, අධ්‍යාපනය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම වැදගත් කාර්යයක් බවත්, පූජනීය ස්ථාන සඳහා හෝ පාසල් සඳහා හෝ සභා අරමුදල් යෙදවීම සම්බන්ධව තමා විරෝධතාවය ප්‍රකාශ කරනු ලබන්නේ ඒ සඳහා රජයේ වෙනත් ආයතන වලින් ප්‍රතිපාදන වෙන් කරන නිසා බවත්, වෙන්දේසි ඉඩම් නිසා සාම්ප්‍රදායික ගම්වල සිටින ජනතාව වෙත හානි සිදු නොවිය යුතු බැවින්, තමා ඒ පිළිබඳව සටන් කරන බවත්, නගරිගෙවත්ත, බටුවන්තුඩාව, පැතුම් උයන වැනි වෙන්දේසි ඉඩම් හරියාකාරව නොකෙරුණ බවත්, ඒවාගෙන් සම්ප්‍රදායික ගමට හානි සිදු නොවිය යුතු බැවින්, ඒ සඳහා ඉදිරියටත් වැඩ කළ යුතු බවත්, පොදු පහසුකම් නංවාලීම සඳහා මාර්ග සංවර්ධනය සිදු කිරීම පිළිබඳව තමා සතුටු වන බවත්, හිටපු අමාත්‍ය ආචාර්ය රිචඩ් පතිරණ මැතිතුමා විසින් වක්වැල්ලේ පාලමක් ඉදිකොට දෙගම් යා කළ බවත්, එම කාර්යයන් අදටත් මහජනතාව විසින් අගය කරන බවත්, ගෝනපුරට යන ඕපාත ප්‍රධාන මාර්ගය තවමත් සංවර්ධනය කර ගැනීමට නොහැකි වූ බැවින්, එම මාර්ගය සංවර්ධනය කර ගැනීම සඳහා මැදිහත් වන ලෙසත්, බැකෝ යන්ත්‍රයේ පරිපාලනය ඉතා දුර්වල බැවින් සහ වැරදි ආකාරයට භාවිතා වන බැවින් නිරන්තරයෙන් අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට ලක් වන බවත්, ඉන්දීය සංචාරයේදී තමා ඇතුළු අනෙකුත් ගරු මන්ත්‍රීවරුන් විසින් ලබා ගත් දැනුමින් බලප්‍රදේශයට ප්‍රයෝජනවත් කාර්යයක් ඉටු කර ගැනීමට නොහැකි වූ බවත්, ඉන්ධනයක් ලෙස මධ්‍යසාර භාවිතා කිරීම පිළිබඳව තමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව හාස්‍යයට ලක් කොට බැහැර කළ බවත්, ජාතිය, ආගම, කුලය මුල් කර ගනිමින් රටකට දියුණු විය නොහැකි බවත්, කසළ දාහක යන්ත්‍රයක් අප ප්‍රාදේශීය සභාවට ලබා ගැනීමට තිබූ අවස්ථාව අහිමිවී ගිය බවත්, එම අවස්ථාව මතුගම ප්‍රදේශයට ලැබුණ බවත්, බෝගහවෙල්ල මාර්ගයේ අනතුරුදායක වංගුව පළල් කිරීම සඳහා මැදිහත් වන ලෙසත්, කුමන ගැටළුකාරි තත්ත්වයන් තිබුණද, අධ්‍යාපන කටයුතු සඳහා සහ සමාජයේ උන්නතිය සඳහා සිදු කරන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම නැවැත්විය නොහැකි බවත්, මධ්‍යම රජයෙන් ග්‍රාම සංවර්ධන කටයුතු සඳහා වෙන් කරන ප්‍රතිපාදන පළාත් පාලන ආයතන හරහා ක්‍රියාත්මක වීම වැදගත් බවත්, මෙම අයවැයට විරුද්ධ බැවින්, තමා විසින් අය වැයට විරුද්ධව ඡන්දය භාවිතා කරන බවත්, එය තමන්ගේ ස්වාධීන අයිතියක් බවත්, ගරු මන්ත්‍රීවරුන්ට කතා කිරීමට ඇති නිදහසට ගරු කරන ලෙසත්, එය වෙනත් ක්‍රම වලින් යටපත් නොකරන ලෙසත්, අදාහනාගාර ඉදිකිරීම අත්‍යාවශ්‍ය දෙයක් බවත්, ඒ සඳහා ක්‍රියාත්මක වීම පිළිබඳව තමා සතුටට පත්වන බවත්, අදාහනාගාරය ඉදිකිරීම පිළිබඳව තමාගේ විරෝධතාවයක් නැති නමුත්, එහි ක්‍රියාවලියට පමණක් තමාගේ විරෝධතාවයක් ඇති බවත්, පෙර පැවති සභා වාරවලදී මෙම සංවර්ධන කටයුතු සිදු කර ගැනීමට නොහැකි වූයේ දේශපාලන අධිකාරියේ තිබූ අඩු පාඩු නිසා බවත්, දේශපාලනය

පිළිබඳව අප්‍රසන්න හැඟීමක් තමාට ඇති බවත්, විගණන කාර්යාලවල සේවය කරන නිලධාරීන්ගේ අඩුවක් පවතින බැවින් විගණන නිලධාරීන්ගේ සංඛ්‍යාව වැඩි කළ යුතු බවත්, අප රටට ජාතික වැඩපිළිවෙලක් සහ ජාතික ප්‍රතිපත්ති අවශ්‍ය කරන බැවින්, ඒවා පක්ෂ භේදයකින් තොරව සාමාන්‍ය ජනතාවගේ සිට ලබා ගත යුතු බවත්, නැතහොත් මේ රට විනාශය කරා ලඟා වන බවත්, ඉදිරියේදී කාරක සභාවල වාර්තා ලබා දීමේදී මුද්‍රිත පිටපත් ලබා දෙන ලෙසත්, තමා විසින් ගෙනියනු ලබන අරගලවලට උරණ නොවන ලෙසත්, අදහස් දක්වන ලද ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් මෙම අයවැය සඳහා තමා විරුද්ධ බවට ප්‍රකාශ කරන ලදී.

**සංශෝධන :- 03.** 2022 වර්ෂයේ වියදම් ඇස්තමේන්තු සාරාංශයේ (වැඩසටහන් අනුව) වියදම් හා වැය විෂය සංකේත නාම තීරුවේ අංක 09. ප්‍රාග්ධන වැය යටතේ පොදු පරිපාලනය සඳහා රු.4,200,000.00, සෞඛ්‍ය සේවා රු.39,687,000.00, භෞතික සැලසුම් හා මංමාවත් රු.3,400,000.00, පොදු උපයෝගීතා සේවා රු.79,127,000.00, සුභසාධක සේවා රු.500,000.00ක් ලෙස වෙන් කොට ඇති ප්‍රතිපාදන, 2022 වර්ෂයේ වියදම් ඇස්තමේන්තු සාරාංශයේ (වැඩසටහන් අනුව) වියදම් හා වැය විෂය සංකේත නාම තීරුවේ අංක 09. ප්‍රාග්ධන වැය යටතේ පොදු පරිපාලනය සඳහා රු.100,000.00, සෞඛ්‍ය සේවා රු.31,714,000.00, භෞතික සැලසුම් හා මංමාවත් රු.20,000,000.00, පොදු උපයෝගීතා සේවා රු.75,000,000.00, සුභසාධක සේවා රු.100,000.00ක් ලෙස ලෙස සංශෝධනය කොට ඒ අනුව එක් එක් වැඩසටහන් සඳහා අදාළ වියදම් ඇස්තමේන්තු වල ප්‍රාග්ධන වැය ශීර්ෂයන් සංශෝධනය කිරීම.

2022 වර්ෂයේ අයවැය සඳහා ඉහත සංශෝධනය ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඕපාත ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ටෙන්ඩර් කොට කොන්ත්‍රාත් ප්‍රදානය ද සිදු කර ඇති බවත්, මාර්ගය මෙන්ම පාලමේ සංවර්ධන කටයුතු සඳහාද ඇස්තමේන්තු සකස් කොට ඇති බවත්, පාලම අසළ සිට ගෝනපුර දක්වා මාර්ගය ගොඩකිරීමෙන් අනතුරුව කාපට් යොදා සංවර්ධනය කිරීමට නියමිත බවත්, ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ඕපාත මාර්ගය පළමුවෙන්ම සංවර්ධනය කිරීමට අවශ්‍යතාවය තිබූ මාර්ගයක් බවත්, එය නොකිරීම පිළිබඳව පමණක් තමා විසින් අදහස් දැක්වූ බවත් ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන තුන ඇතුළත්ව අද දිනයේදී අයවැය සභා සම්මත කර ගැනීමට අදහස් කරනවාද යනුවෙනුත්, සංශෝධිත අයවැය ලේඛනය ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සඳහා ලබා දෙනවාද යනුවෙනුත් ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

ඉදිරිපත් කරන ලද සංශෝධන තුන සහිතව අද දිනයේදී 2022 වර්ෂය සඳහා අදාළ අයවැය සභා සම්මත කර ගැනීමට කටයුතු කරන බවත්, ඉදිරියේදී සභා සම්මත වූ අයවැය ලේඛනය ගරු මන්ත්‍රීවරුන්ගේ භාවිතය සඳහා ලබා දෙන බවත්, 2022 වර්ෂය සඳහා අදාළ අයවැය සඳහා විරෝධතා ඉදිරිපත් වූ බැවින් 2022 වර්ෂය සඳහා අදාළ සංශෝධිත අයවැය සභා සම්මත කිරීම සඳහා ඡන්ද විමසීමක් පවත්වන බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 11

විපක්ෂව - 07

ඡන්දය භාවිතා කිරීමෙන් වැළකී සිටි - 01

**2022 වර්ෂය සඳහා අදාළ අයවැය සභා සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් ගරු සභිකවරු**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා

07. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
08. ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය
09. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
10. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
11. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා

**2022 වර්ෂය සඳහා අදාළ අයවැය සභා සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් ගරු සභිකවරු**

01. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
03. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
04. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
05. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
06. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
07. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**2022 වර්ෂය සඳහා අදාළ අයවැය සභා සම්මත කිරීම සඳහා ඡන්දය භාවිතා කිරීමෙන් වැළකී සිටි ගරු සභිකවරු**

01. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා

2022 වර්ෂය සඳහා අදාළ සංශෝධිත අයවැය වැඩි ඡන්ද 04 කින් සභා සම්මත විය.

**<u>(ඊ) කාරක සභාවල වාර්තා</u> ඃ- නැත**

**<u>(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-</u> නැත**

**<u>(ඌ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා</u> ඃ- නැත**

**<u>විශේෂ මහා සභා රැස්වීම සඳහා සහභාගී නොවූ ගරු සභිකවරු</u>**

01. ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා
02. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
03. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මෙම අයවැය සභා සම්මත කර ගැනීම සඳහා සහයෝගය ලබා දෙන ලද ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ගරු උප සභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීවරු වෙනුවෙන් තමාගේ ගෞරවනීය සහ කෘතවේදී ස්තුතිය පළ කරන බවත්, ගිය අයවැයේදී සහයෝගය ලබා දුන් සියළුම මන්ත්‍රීවරුන්ටද ස්තුතිය පුද කරන බවත්, ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් මෙම අයවැය සඳහා ඡන්දය පාවිච්චි කිරීමෙන් වැලකී සිට වක්‍රාකාරව ලබා දුන් සහයෝගය පිළිබඳව ස්තුතිය පුද කරන බවත්, අද දින විශේෂ මහා සභා රැස්වීම සඳහා නොපැමිණ වක්‍රාකාරව සහයෝගය ලබා දුන් ගරු මන්ත්‍රීවරුන්ටත් ස්තුතිය පුද කරන බවත්, ඉදිරි වර්ෂයේදී සියළුදෙනා එකතු වී අප ප්‍රාදේශීය සභාවේ අරමුණු ඉෂ්ට කර ගැනීම සඳහා සහයෝගය ලබා දෙන ලෙසත්, ඉල්ලා සිටිමින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් විශේෂ මහා සභා රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.